පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.13 පැය 0700 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out /721/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**කොල්ලකා පලා යමින් තිබූ කාර් රථයකට පොලිසිය වෙඩිතබා අත්අඩංගුවට ගැනීම - කොටහේන පොලිස් වසම.**

2024.04.12 වන දින රාත්‍රී කාලයේ කොටහේන පොලිස් වසමේ වාසල පාර, කොටහේන වීදිය ප්‍රදේශයේදී තම ගැබිණි බිරිඳ හා මව සමඟ කාර් රථයකින් පැමිණි පුද්ගලයෙකු කාර් රථයේ එන්ජිම පණගන්වා තිබියදී ආහාර මිලදී ගැනීම සඳහා කාර් රථයෙන් බැස කොටහේන වීදියේ පිහිටි අවන්හලක් වෙත ගොස් ඇත.

එම අවස්ථාවේ පුද්ගලයෙකු විසින් රියදුරුගේ බිරිඳ හා මව කාර් රථය තුල සිටියදීම පණගන්වා තිබූ කාර් රථය කොල්ලකා පලා ගොස් ඇත. එම අවස්ථාවේදී විමශර්න කටයුත්තක් සඳහා කැබ් රථයකින් කොටහේන පොලිස් වසමට පැමිණ සිටි මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමකට මෙම කාර් රථය කොල්ලකෑම සම්බන්ධයෙන් ලද තොරතුරක් මත වහාම ක්‍රියාත්මක වී පලා යමින් තිබූ කාර් රථය පසුපස ලුහුබැඳ ගොස් එය නැවත්වීමට සංඥා කර ඇත. සැකකරු විසින් පොලිස් අණ නොතකා තවදුරටත් කාර් රථය ධාවනය කිරීමේදී පොලිස් නිලධාරින් විසින් රාජකාරි පිස්තෝල අවියකින් වෙඩි පහරවල්දෙකක් තබා ඇති අතර කොටහේන පොලිස් වසමේ බ්ලූමැන්ඩල් දුම්රිය මාගර්ය අසලදී කාර් රථය නතර කර ගැනීමට සමත්වී ඇත. නිලධාරින් කාර් රථය අසලට යන අවස්ථාවේදී සැකකරු කාර් රථයෙන් බැස පලාගොස් ඇති අතර කාර් රථය තුල සිටි කාන්තාවන් දෙදෙනාට කිසිදු අනතුරක් සිදුව නොමැත.

පලාගිය සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා කොටහේන පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**